# ඌව පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උපාධිධාරින්ගෙන් සහ දෑවුරුදු ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම - 2016

ඌව පළාත් සභා පාසල්වල 6 - 11 ශ්‍රේණිවල පහත සඳහන් විෂයන්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I (අ) ශ්‍රේණියට හා ඩිප්ලෝමාධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ඌව පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරින්ගෙන් / ඩිප්ලෝමාධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

උපලේඛණ අංක 01 - පුරප්පාඩු විෂය ලේඛණය

| අ.අ | විෂය | විෂය කේත අංකය |
|---|---|---|
| 01 | විද්‍යාව - සිංහල මාධ්‍ය | 11 |
| 02 | විද්‍යාව - දෙමළ මාධ්‍ය | 12 |
| 03 | විද්‍යාව - ඉංග්‍රීසි මාධ්‍ය | 13 |
| 04 | ගණිතය - සිංහල මාධ්‍ය | 21 |
| 05 | ගණිතය - දෙමළ මාධ්‍ය | 22 |
| 06 | ගණිතය - ඉංග්‍රීසි මාධ්‍ය | 23 |
| 07 | ඉංග්‍රීසි | 30 |
| 08 | ශාරීරික අධ්‍යාපනය - සිංහල මාධ්‍ය | 31 |
| 09 | ශාරීරික අධ්‍යාපනය - දෙමළ මාධ්‍ය | 32 |

01. **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

(අ) අයදුම්කරු /අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) 2016.10.21 දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඌව පළාත තුල තිබිය යුතුය. (ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරනු ලබන පදිංචිය පිළිබඳ ග්‍රාම සේවා සහතිකයක් මගින් සම්මුඛ පරික්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය).

ඌව පළාත් සභා සීමාව තුළ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වසර 03 ක් හෝ ඊට වැඩි ස්ථිර පදිංචියක් ඇති අයකු සමග නීත්‍යානුකූලව විවාහ වී ඌව පළාතේ පදිංචියට පැමිණ අයදුම්පත් කැඳවන අවසාන දිනට ඡන්ද හිමි නාමලේඛණයෙන් ලියාපදිංචිය සනාථ කරන කෙනෙකුට ද අයදුම් කළ හැක. එවැනි අය ලිඛිත සාක්ෂි මගින් මෙම තත්ත්වය තහවුරු කිරීම අනිවාර්ය වේ.

(ඈ) 2016.10.21 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

02. **අධ්‍යාපන සුදුසුකම් :-**

2.1 **එක් එක් විෂයට අදාළව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම් 2016.10.21 දිනට හෝ ඊට පෙර වලංගු පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.**

| අ.අ | විෂය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| **1** | විද්‍යාව | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ අයතනයක් මගින් පිරිනමනු ලබන **ජෛවීය විද්‍යා උපාධියක් ලබා තිබීම.** |
| **2** | ගණිතය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ අයතනයක් මගින් පිරිනමනු ලබන **භෞතීය විද්‍යා උපාධියක් ලබා තිබීම.** |
| **3** | ඉංග්‍රීසි | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ අයතනයක් මගින් ඉංග්‍රීසි විෂය හෝ ඉංග්‍රීසි සාහිත්‍ය ප්‍රධාන විෂයක් සහිතව හදාරා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උපාධියක් ලබා තිබීම (ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෙනත් උපාධියක් හදාරා තිබීම සුදුසුකමක් නොවේ).<br>හෝ<br>ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් පිරිනමන උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව හෝ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පිරිනමනු ලබන දෙවසරකට නොඅඩු පාඨමාලා කාල පරාසයක් සහිත ජාතික වෘත්තීය කුසලතා මට්ටම් හය (NVQ 06) ට නොඅඩු ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>සහ<br>අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. |
| **4** | ශාරීරික අධ්‍යාපනය | ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂි කරන ලද විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ අයතනයක් මගින් පිරිනමනු ලබන **ශාරීරික අධ්‍යාපනය / ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය විෂයට අදාළ උපාධියක් ලබා තිබීම.** |

2.2 **අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස. සා/පෙළ හා අ.පො.ස. (උ/පෙළ) විභාග පහත පරිදි සමත්ව තිබිය යුතුය.**

- විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව භාෂාව/සාහිත්‍ය හා අංක ගණිතය/ගණිතය විෂයන්ද ඇතුළුව, විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම සමග
- අ.පො.ස. (උ/පෙළ) නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වීම හෝ
- අ.පො.ස. (උ/පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සහිතව (අවම වශයෙන් විෂයන් 03 කින් ) එකවර සමත් විය යුතුය.

සටහන - විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස (උ/පෙළ ) විභාග හා සාමානව පිළිගනු ලබන විභාග සමතුන්ටද අයදුම් කළ හැක.

03. **සේවා කොන්දේසි :-**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

(ඇ) වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාතේ වෙනත් පාසලකට සේවා අවශ්‍යතාවය මත ඌව පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව ස්ථාන මාරුවීම් ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දීමට සළකා බලනු ඇත.

(ඈ) රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

(ඉ) 2016.02.25 දිනැති රා.ප.ච. අංක **03/2016 හි GE-1-2016 වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු. 27,740/- 300 x 6 - 380 x 7 - 445 x 2 - 33,090 /- මාසික** වැටුප් පරිමාණය අනුව උපාධිධාරින් 14 වන වැටුප් පියවර වන රු. 32,200/- ක මාසික වැටුප් පියවරෙහි ද, ඩිප්ලොමාධාරින් 7 වන වැටුප් පියවර වන රු.29,540/- මාසික වැටුප් පියවරෙහි ද පිහිටුවනු ලබන අතර, ගෙවීම් කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ 7.1 ඡේදය අනුවය. ඒ අනුව, එම චක්‍රලේඛයේ උපලේඛණ අංක II අනුව එක් එක් වර්ෂය යටතේ දක්වා ඇති පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

4.1 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 1885/38 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.2 සහ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව පාසල් පාදක ක්‍රමය අනුව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

4.2 එක් එක් විෂය සඳහා ලැබුණු නියමිත සුදුසුකම් සහිත විධිමත් අයදුම්පත් සංඛ්‍යාව එම විෂයෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වූ විට තරග විභාගයකින් තොරව ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කර සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.3 එක් එක් විෂයට ලැබී ඇති නියමිත සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වුවහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ලකුණුවල කුසලතා අනුපිළිවෙල පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් නියමිත ගුරු පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

4.4 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.5 **ප්‍රායෝගික පරීක්ෂණය** :

ගුරු වෘත්තීයේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලේ. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් නිර්ණායක පදනම් කොට ගෙන මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. **කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ. - උපරිම ලකුණු 25**

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | නිර්ණායකයන්හි අරමුණ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ඨ වීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතුවීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම. | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් /ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| | | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

- ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

4.6 එමෙන්ම මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

05. **අයදුම් කළ යුතු පිළිවෙල :-**

5.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 07 දක්වා කොටස් පළමු පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය සැකසිය යුතුය. එමෙන්ම අයදුම්පත්‍රය සකස් කර ගැනීමේදී එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

5.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2016.10.21 දින හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිළිපොතගම පාර, පිංඅරාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "ඌව පළාත් සභා පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන්ගෙන් සහ දැවුරුදු ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම - 2016" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

5.4 අයදුම්පත සමග උපාධියේ / ඩිප්ලෝමාවේ වලංගු දිනය නිශ්චිතව සඳහන් වන සහතිකයේ ඡායා පිටපතක් සහතික කර අමුණා එවීම අනිවාර්ය වේ.

5.5 අයදුම්කරුවෙකුට එක් විෂයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම්කරනු ලබන විෂය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සළකා බලනු නොලැබේ. උපලේඛණ අංක 01 අනුව අයදුම්කරනු ලබන විෂය හා විෂය කේත අංකය සඳහන් කළ යුතුය.

5.6 එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පතෙහි තම මනාපයේ අනුපිළිවෙල අනුව උපලේඛණ අංක 02 හි සඳහන් ගුරු පුරප්පාඩු අතරින් ඉල්ලුම් කරන විෂයට අදාළව පුරප්පාඩු පවතින පාසල් 03 ක් පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් කරන පාසල් හා එහි අනුපිළිවෙල පසුව වෙනස් කරනු නොලැබේ. සේවා අවශ්‍යතාවය මත ඉල්ලුම් කරන ලද පාසැලකට හැර වෙනත් පාසැලකට පත්කළ හැකි අතර, පාසල් නම් කිරීම ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකරනු ලැබේ.

5.7 නියමිත ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය පුවත් පත් නිවේදනයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීමකි. අයදුම්පත්‍ර තැපෑලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.8 දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ / රාජ්‍ය සේවයේ / අර්ධ රාජ්‍ය සේවයේ නියුක්ත සේවකයින් / නිලධාරින් විසින් අයදුම්පත්‍රයේ 12 හි විස්තර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් සනාථ කර අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

5.9 **අත්සන සහතික කිරීම :-**

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ/පළාත් රාජ්‍ය සේවයේ / අර්ධ රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු /සාමදාන විනිශ්වයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06. **විභාග පටිපාටිය සහ තරග විභාගයේ විෂය නිර්දේශය :-**

6.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතික පරීක්ෂා කිරීමකින් තොරව තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව මෙම කොමිෂන් සභාවෙන් / විභාග කොමසාරිස් ජනරාල්ගෙන් විමසිය යුතුය. එසේ විමසීමේදි අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ නම ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවූ ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදි ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපත ද ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.2 තරග විභාගය බදුල්ල සහ මොණරාගල නගරවලදී පැවැත්වෙනු ඇත. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් බදුල්ල නගරයේදි පමණක් විභාගය පැවැත්වෙනු ඇත.

6.3 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් / ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් / ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඩුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

6.4 විභාග දිනයේදි අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

6.5 තරග විභාගයට සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදි අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ.

6.6 මෙම තරග විභාගය තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපෙක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.7 තරග විභාගය බහුවරණ හා කෙටි පිළිතුරුවලින් සමන්විත පහත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02 ) සඳහාම පෙනී සිටිය යුතුය.

- **අභියෝග්‍යතාව - කාලය පැය 01 - ලකුණු 100**

  අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.

- **සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100**

  ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා /හෝ දේශීය වශයෙන් සිදු වී ඇති සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරග විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත යුතුය.

6.8 ඌව පළාත් සභා පාසල්වල 6-11 ශ්‍රේණි සඳහා විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයන්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට 2016.03.04 දින පලකරන ලද පුවත්පත් නිවේදනය අනුව 2016.05.15 වන දින පවත්වන ලද විවෘත තරග විභාගයට පෙනී සිට සමත්ව එහි ප්‍රතිපල මත සම්මුඛ පරීක්ෂණට කැඳවන ලද නමුත් අදාළ උපාධිය / ඩිප්ලෝමාව සම්පූර්ණ කරන ලද දිනය එම නිවේදනයට අනුකූල නොවීම නිසා බඳවා ගත් කණ්ඩායමට ඇතුළත් නොවූ අය මෙම නිවේදනය ප්‍රකාරව අයදුම්පත් ඉදිරිපත් කර ඇත්නම් ඔවුන් විභාගය සමත් සේ සළකා ඉහත ඡේදයේ විස්තර කර ඇති විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

07. **විභාග හා පරිපාලන ගාස්තු :**

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.600/- කි. මෙම මුදල *<u>ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පමණක්</u>* මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයෙ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

08. **සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

09. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම /නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම් / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

(ආර්.එම්.ටී.බී.හාතියල්දෙණිය)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016.09.28 වන දින.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
බදුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

## ඌව පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උපාධිධාරීන්ගෙන් සහ ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම - 2016

## Calling Application from the Graduates and English Diploma Holders To Fill the Existing Teacher Vacancies in Uva Provincial Council Schools - 2016

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

01. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :

(ඔබ අයත්වන දිස්ත්‍රික්කය "බදුල්ල" ද "මොණරාගල" ද යන්න පැහැදිලිව සඳහන් කරන්න).

02. 2.1 විභාගයට පෙනී සිටින නගරය :
(බදුල්ල - 1, මොණරාගල - 2 )

| නගරය | නගර අංකය |
|---|---|
| | |

2.2 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල -2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4

2.3 ඉල්ලුම් කරනු ලබන විෂය :

| විෂය | විෂය කේත අංකය |
|---|---|
| | |

(උපලේඛන අංක 01 අනුව ඔබ අයදුම්කරන විෂය හා විෂය කේත අංකය සඳහන් කරන්න)

2.4 ඉල්ලුම් කරන පාසල : :

| අනු. අංකය | දිස්ත්‍රික්කය | කලාපය | පුරප්පාඩු පාසල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

(උපලේඛණ 02 හි සඳහන් අයුරින් ඔබ අයදුම්කරන විෂයට අදාළව පුරප්පාඩු පවතින පාසල් 03 හා පාසලට අදාළ අනුක්‍රමික අංකය මනාපයේ අනුපිළිවෙලින් සඳහන් කළ යුතුය. මෙම අනුපිළිවෙල කිසිදු අයුරකින් වෙනස් කරනු නොලබේ.)

03. 3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................

3.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම :Mr/Mrs/Miss ................................
..........................................................................
((ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- HERATH A.M.N.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :..........................................................................

04. 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................
..........................................................................

4.2 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :..........................................................................

4.3 දුරකථන අංකය :......................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. 6.1 උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.2 2016.10.21 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

6.3 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0 ☐

6.4 විවාහක / අවිවාහක භාවය : විවාහක - 1 / අවිවාහක - 2 ☐

07. 2016.10.21 දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

08. අධ්‍යාපන සුදුසුකම් :-

8.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය:

| | වර්ෂය :..................... විභාග අංකය :..................... | | | | |
|---|---|---|---|---|---|
| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
| 1 | | | 5 | | |
| 2 | | | 6 | | |
| 3 | | | 7 | | |
| 4 | | | 8 | | |

8.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| | වර්ෂය :.......... විභාග අංකය :................ | |
|---|---|---|
| | විෂයය | සාමාර්ථය |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

8.3 ලබාගෙන ඇති උපාධිය/ඉංග්‍රීසි ඩිප්ලෝමාව පිළිබඳ විස්තර :

| උපාධිය / ඩිප්ලෝමාව | ලබාගත් ආයතනය | වලංගු දිනය | හදාරා ඇති විෂයයන් | උපාධිය/ඩිප්ලෝමාව ලබා ඇති මාධ්‍ය |
|---|---|---|---|---|
| | | | | |

(උපාධියේ/ඩිප්ලෝමා සහතිකයේ සහතික කළ පිටපතක් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය)

09. ගෙවා ඇති විභාග ගාස්තුව : රු. :......................................................
විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :...............................

ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :......................................................

මුදල් ගෙවූ ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න

10. අයදුම්කරුගේ සහතිකය :

............................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම්කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව දනිමි. තවද, තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් / ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිපල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය :...........................................  ..............................................................
අයදුම්කරුගේ අත්සන

11. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................. ලිපිනයේ පදිංචි ................................................................................ මයා /මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය ...................................... දින මා ඉදිරිපිටදී ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :......................................  ..................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන අයගේ සම්පූර්ණ නම :.................................................................
තනතුර :................................................................
ලිපිනය :................................................................
................................................................

12. අයදුම්කරු / අයදුම්කාරිය රජයේ සෙවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ...................................................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .................................................... තනතුරේ ස්ථිර / අනියම් / තාවකාලික පදනම මත සේවය කරන බවද, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි /නොහැකි බවද දන්වමි.

දිනය :..................................  .................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම:............................................................
තනතුර :............................................................
ලිපිනය :............................................................
............................................................